ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

<u>ඉන්දීය ප්‍රදාන යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉදි කළ පතිනිගම ආදර්ශ ගම්මානය විවෘත කෙරේ</u>

2026 ජූනි 4 වන දින ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා සහ නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍ය ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මැතිතුමා විසින් කුරුණෑගල පතිනිගම ආදර්ශ ගම්මානය ප්‍රතිලාභී පවුල් 24 වෙත භාර දෙන ලදී. වයඹ පළාත් ආණ්ඩුකාර තිස්ස කුමාරසිරි වර්ණසූරිය; කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන සහ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුජීව ඉන්දික දිසානායක යන මහත්වරුන් ඇතුළු සම්භාවනීය අමුත්තන් පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

2. ශ්‍රී ලංකාවේ නිවාස, ඉදිකිරීමේ සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්; ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ කුරුණෑගල දිස්ත්‍රික් පරිපාලනයේ නිලධාරීන් ඇතුළු පිරිසක් ද මෙම අවස්ථාව සඳහා සහභාගී වූහ.

3. මෙම අවස්ථාව අමතමින්, මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය සඳහා ඉන්දියාවේ අචල කැපවීම අවධාරණය කළේය. ඉන්දියාව දේශීය ජීවනෝපායන් වැඩිදියුණු කිරීමට සහ දිවයින පුරා ප්‍රජාවන්ගේ සාකල්‍ය වර්ධනයට සහයෝගය ලබා දීමට තවදුරටත් කැප වී සිටින බව එතුමා ප්‍රකාශ කළේය.

4. ඉන්දීය රජයේ ප්‍රදාන යටතේ ශ්‍රී ලංකාවේ නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය සමඟ එක්ව ක්‍රියාත්මක කරන ආදර්ශ ගම්මාන නිවාස ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 තුළම ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය සඳහා වන අවබෝධතා ගිවිසුම 2017 ඔක්තෝබර් මස ඉන්දීය රජය සහ ශ්‍රී ලංකා රජය අතර අත්සන් තබන ලදී. එක් දිස්ත්‍රික්කයක නිවාස 24කින් සමන්විත ආදර්ශ ගම්මානය බැගින් ඉදිකෙරෙන මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ අඩු ආදයම්ලාභී පවුල් 600ක් සඳහා නිවාස පහසුකම් හිමි වේ. දිස්ත්‍රික් නිවාස කමිටු විසින් ප්‍රතිලාභී පවුල් තෝරා ගනු ලැබේ.

5. මේ වන විට දිස්ත්‍රික්ක 17ක එනම් මඩකලපුව, වවුනියාව, යාපනය, මහනුවර, ගම්පහ, අනුරාධපුර, බදුල්ල, මාතලේ, පුත්තලම, කොළඹ, ත්‍රිකුණාමලය, මොණරාගල, කිළිනොච්චි, මුලතිව්, රත්නපුර සහ අම්පාර යන දිස්ත්‍රික්කවල ආදර්ශ ගම්මාන ඉදි කර ඇත. සමස්තයක් වශයෙන් ව්‍යාපෘතියේ කටයුතු 98.5%ක් අවසන් වී ඇති අතර ඉතිරි ගම්මාන ද නුදුරේදීම ප්‍රතිලාභීන්ට භාර දීමට අපේක්ෂිතය.

****

**කොළඹ**
***2026 ජූනි 05***